# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,357 - 2023 නොවැම්බර් මස 03 වැනි සිකුරාදා - 2023.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 590 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 නොවැම්බර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 නොවැම්බර් මස 10 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

**සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

රත්මලාන, බොරුපන පාර, සමගි මාවත, අංක 17 දරන ස්ථානයෙ හි තම ලියාපදිංචි කාර්යාලය සහිත ඊසී ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 7277) (EZY Distribution (Private) Limited) සම්බන්ධ කාරණාවේ දී ය.

නඩු අංකය : CHC 56/2023/CO
ස්වභාවය : ඈවර කිරීම්
පටිපාටිය : ලඝු

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදයේ 270 (ඉ) සහ 270 (ඊ) වගන්ති යටතේ සහ ඒ ප්‍රකාර ව අධිකරණය මගින් ඈවර කරනු ලැබීම සඳහා වූ ඉල්ලීමකි.

සෙලාන් බැන්ක් පී. එල්. සී.
සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර,
කොළඹ 03.

..........................*පෙත්සම්කරු.*

රත්මලාන, බොරුපන පාර, සමගි මාවත, අංක 17 දරන ස්ථානයෙ හි තම ලියාපදිංචි කාර්යාලය සහිත ඊසී ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 7277) (EZY Distribution (Private) Limited) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වර්ෂ **2023 ක් වූ අගෝස්තු මස 03 වැනි දින** දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත් මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම විමසීම වර්ෂ **2023 ක් වූ දෙසැම්බර් මස 14 වැනි දිනට** නියමකර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධයෙන් නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණය හිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥ තැනගෙන් ඉල්ලා සිටි විට ලබාගත හැකි බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ,*

වයෝමා, ඒ. පරණගම මහත්මිය සහ ඇයගේ සහාය නීතිඥවරු,
නීති අංශය, සෙලාන් බැන්ක් පීඑල්සී,
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

***සටහන.***- මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් පෙත්සම්කරු වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම, සහ ලිපිනය ද, සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද, දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර, වර්ෂ **2023.12.13 වැනි දින පස්වරු 4.00 ට** පෙර භාර දිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

වර්ෂ 2023 ක් වූ ඔක්තෝබර් මස 16 වැනි දින දී ය.

11-15

**සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII යටතේ සමාගම් ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් කරනු ලබන ඉල්ලීමයි.

මොහොමඩ් සාලි අක්බාර් අලි,
අංක 432/01/02,
ඇලබඩගම,
පන්නල.

..........................*පෙත්සම්කරු.*

නඩු අංකය : CHC/64/2023/CO
ස්වභාවය : ඇවර කිරීම

*එදිරිව*

Blue Chip SL (Pvt.) Ltd.,
Coco Building,
අංක 127, ග්‍රෑන්ඩ්පාස් පාර,
කොළඹ 14.

.................*ගණන් බේරා වසා දැමීමට යෝජිත සමාගම.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දමීම පිණිස පෙත්සමක් **2023ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින** එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ලක්ෂිත වික්‍රමරත්න විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම සම්බන්ධයෙන් සමාගම වෙත නොතීසි නිකුත් කර වාර්තා **2023.12.08 වැනි දිනට** කැඳවීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයෙකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් වන මා විසින් සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලක්ෂිත වික්‍රමරත්න,
අංක 391/A/3, වේල්ල වීදිය,
කොළඹ 12.

**සටහන.-** එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ලක්ෂිත වික්‍රමරත්න වන මා වෙත භාර දිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතු ය. එම දන්වීමෙ හි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන් **2023.12.06 වැනි දින පස්වරු 1.00ට** පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතුව තැපැල් කළ යුතු ය.

11-61

**සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පවත්වන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස හා ගණන් බේරා වසා දැමීමේ රීති යටතේ අංක 265, ගාලු පාර, කොළඹ 03 හි පිහිටි ලංකා හොටෙල් ඇන්ඩ් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සම්බන්ධ කාරණාවේ දී ය.

එච්. සී. සිවිල් නඩු අංකය :
සීඑච්සී 76/2023/CO

තුඩාවෙ ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 505/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

.........................*පෙත්සම්කරු.*

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා පෙත්සම්කරු වන කොළඹ 05, ඇල්විටිගල මාවත, අංක 505/2 හි තුඩාවෙ ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් **2023 සැප්තැම්බර් 26 දින** එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම **2024 ජනවාරි මස 10 වැනි දින** අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥ මහතකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥයින්,
අංක 28, (2 වන මහල),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

*සටහන.*- එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ අදහස ඉහත නම් සඳහන් නීතිඥ ව්‍යාපාරය වන නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස් මහතුන් වෙත ලිඛිතව හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. තැපැල් මගින් එවීම අවශ්‍ය වන පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය නොතිසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය **2024 ජනවාරි මස 09 වැනි දින පස්වරු වේලාව 6.00** ට පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල් වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ කිරීම අවශ්‍ය වේ.

නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥයින්.

11-24

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2023.11.03 | සිකුරාදා | 2023.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.10 | සිකුරාදා | 2023.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.17 | සිකුරාදා | 2023.11.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.24 | සිකුරාදා | 2023.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2023.12.01 | සිකුරාදා | 2023.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.08 | සිකුරාදා | 2023.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.15 | සිකුරාදා | 2023.12.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.22 | සිකුරාදා | 2023.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.29 | සිකුරාදා | 2023.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2024 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2024.01.05 | සිකුරාදා | 2023.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.12 | සිකුරාදා | 2023.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.19 | සිකුරාදා | 2024.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.26 | සිකුරාදා | 2024.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.